ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date. 2024.11.25

එන්.ඩබ්.ආර්. ගුණරත්න මයා

මහගෙදර,

පාතේගම,

කෝට්ටගොඩ.

**-පැමිණිලිකරු -**

**පැමිණිලි අංකය : HRC/MTR/259/21/ N**

යුධ හමුදාපති

යුධ හමුදා මූලස්ථානය

ශ්‍රී ජයවර්ධනපුර

**-වගඋත්තරකරු-**

**<u>පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම</u>**

පැමිණිලිකරු යුද්ධ හමුදා සේවයෙන් විශ්‍රාම යාමෙන් පසු රාජ්‍ය නොවන ගිණුමක මුදල් අක්‍රමිකතාවයක් සම්බන්ධයෙන් ලබා දුන් යුධ හමුදාපති තිගමනයට අනුව පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුපෙන් මාසිකව මුදල් අයකර ගැනීම නතර කර දෙන ලෙසත්, අයකළ මුදල් නැවත ලබා දෙන ලෙසත් සුභසාධක ගිණුමේ රදවා තබා ගෙන ඇති තැන්පත් ඉතිරි කිරීම මුදල් ලබා දෙන ලෙසත් ඉල්ලා මෙම පැමිණිල්ල 2021.10.25 වන දින කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

**පැමිණිල්ලේ වැඩිදුර කරුණු දැක්වීම :-**

- 1994.09.12 දින ලිපිකරුවකු ලෙසින් යුධ හමුදාවට බැඳි විශ්‍රාම යන තෙක්ම සුභ සාධක ගිණුම් අංශයේ රාජකාරි කළ බවත්.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

- විශ්‍රාම යාමට ප්‍රථම සුභ සාධක ගිණුමට අදාල සියලු ගිණුම් පොත් හා ලියකියවිලි නිශ්කාෂණ සහිතව ඒකකය වෙත ගොස් විශ්‍රාම යාමට අදාළ ඉදිරි කටයුතු නිසි අයුරින් සිදුකර 2018.02.18 දින යුධ හමුදාවෙන් විශ්‍රාම ගිය බවත්.

- විශ්‍රාම යාමෙන් පසු ඉහත සඳහන් ගිණුමේ 2009.07.01 සිට 2013.09.30 දක්වා ගිණුම් පරික්ෂණයක් සිදුකර රු:4,027,000/-ක මුදල් අක්‍රමිකතාවයක් සිදුවී ඇති බැව් යුධ හමුදාව විසින් නිරික්ෂණය කර එම මුදල සඳහා අදියර 02ක් යටතේ මූලික පරික්ෂණ උසාවි සිදුකර එහි පළමු අදියර යටතේ අක්‍රමික මුදල් වටිනාකමින් රු:2,377,000/-ක මුදල සඳහා පැවැත්වෙන මූලික පරික්ෂණ උසාවිය වෙත පැමිණ ප්‍රකාශයක් ලබා දෙන ලෙස ලිඛිතව දැන්වීමෙන් පසු විශ්‍රාමිකව සිටියත් ඊට සහභාගි වී ප්‍රකාශයක් ලබා දුන් බවත්.

- ඉන් පසු දෙවන අදියර යටතේ රු:1,650,000/- මුදල සඳහා සිදුකරන මූලික පරික්ෂණ උසාවිය වෙත පැමිණ ප්‍රකාශයක් ලබා දෙන ලෙස කරන ලද දැනුම් දීමට අනුව පෞද්ගලික හේතුන් මත පැමිණීමට නොහැකි වූ බැවින් තමා මීට පෙර ලබා දුන් ප්‍රකාශයම ඒ සඳහා ඇතුලත් කරගන්නා ලෙසට වගඋත්තරකාර පාර්ශවය දැනුවත් කළ බවත්.

- පළමු අදියර යටතේ පැවති මූලික පරික්ෂණ උසාවියට අනුව රු:891,375/-ක මුදලක් තමාගෙන් අයකර ගන්නා ලෙසටත් එසේ නොගෙවන්නේ නම් තමාගේ විශ්‍රාම වැටුපෙන් අයකර ගන්නා ලෙසටත් යුධ හමුදාපති නිගමනයක් ලබාදී ඇති අතර ඒ අනුව තම විශ්‍රාම වැටුපෙන් රු:18,000/-බැගින් මාස 50කින් මෙම මුදල නිරවුල් වන සේ 2020 ඔක්තෝබර් මස සිට මේ දක්වාම අඩුකර ගන්නා බවත්.

- දෙවන අදියර යටතේ පැවති මූලික පරික්ෂණ උසාවිය අනුව තවත් රු:618,750/-ක මුදලක් තමාගෙන් අයකර ගැනීමට යුධ හමුදාපති නිගමනයක් ලබාදී ඇති අතර එහිදී සඳහන් කර ඇත්තේ අක්‍රමිකතාවට අදාළ මුදල රජයේ මුදල් නොවන බැවින් එය තමා සමග සම්බන්ධතාවයෙන් වසරක් ඇතුලත අයකර ගන්නා ලෙසටත් එසේ නොහැකිනම් අදාල ගිණුමෙන් එම මුදල කපා හරින ලෙසටත් වන බවත් පැමිණිලිකරු විසින් සිය පැමිණිල්ල තුලින් දක්වා ඇත.

**<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>**

වගඋත්තරකාර පාර්ශවය වන ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය විසින් අංක යුහ/නීති/350/මාහිකො/1902(09) සහ 2022.02.22 දිනැති වාර්තාව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින්.

- මෙම පැමිණිලිකරු ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකා රෙජිමේන්තු සුභසාධක ගිණුම් අංශයේ ගිණුම්භාර බලලත් නිලධාරි ලෙස සේවය කර 2018.02.18 වන දින විශ්‍රාම ගොස් ඇති බවත්.

- යුධ හමුදා අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2017.08.11 දින සිට 2018.03.19 දක්වා කාලසීමාව තුළ 2009.07.03 දින සිට 2013.09.30 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළව ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකා රෙජිමේන්තු සුභසාධක ගිණුම් විගණනයට ලක්කර ඇති අතර එහිදි එම ගිණුමේ රු:2,377,000/- මුදලක අක්‍රමිකතාවයක් සිදුව ඇති බව නිරීක්ෂණය කර ඇති අතර ඒ පිළිබඳව සොයා බැලීම සඳහා 1952 මූලික පරීක්ෂණ උසාවි රෙගුලාසි මාලාවේ උපදෙස් පරිදි යුධ හමුදාව විසින් මූලික පරීක්ෂණ උසාවියක් පත්කර ඇති අතර එම මූලික පරීක්ෂණ උසාවි වාර්තාව අනුව 2020.05.12 දින යුධ හමුදාපති නිගමනය ලබාදී ඇති බවත්.

- එම යුධ හමුදාපති නිගමනය අනුව එකී අක්‍රමිකතාවයට වගකිව යුතු අයට එරෙහිව විනයානුකූලව කටයුතු කර එම අක්‍රමිකතා මුදල් ඔවුන් වෙතින් අත්කර ගැනිමටත් විශ්‍රාමික අයගෙන් එම මුදල් ඔවුන් හා සම්බන්ධතාවයෙන් යුතුව අයකර ගත නොහැකි නම් ඔවුන්ගේ විශ්‍රාම වැටුපෙන් අයකර ගත යුතු බවටත් නිගමනය කර ඇති බවත්.

- එකී මූලික පරීක්ෂණ උසාවිය මගින් මෙම අක්‍රමිකතාවයේ සම්පූර්ණ වටිනාකම රු:2,377,000/- නොව එය රු:4,027,000/-ක මුදලක් බවට හෙළිවූ බැවින් ඉතිරි රු:1,650,000/-ක අක්‍රමිකතා මුදල සම්බන්ධයෙන් තවදුරටත් සොයා බැලීමට නැවතත් මූලික පරීක්ෂණ උසාවියක් සිදුකළ යුතු බවට 2020.05.12 වන දින යුධහමුදාපති නිගමනය කිරීමෙන් අනතුරුව නැවත මූලික පරීක්ෂණ උසාවියක් පත්කළ බවත්.

- එම මූලික පරීක්ෂණ උසාවි වාර්තාව පදනම් කරගෙන 2020.11.16 දිනැතිව යුධ හමුදාපති නිගමනයක් ලබා දී ඇති අතර එකී නිගමනය අනුව අදාල වගකිවයුතු අයවලුන්ගෙන් එක් එක් ප්‍රමාණවලින් මුදල් අයකර ගැනිමටත් විශ්‍රාම ගොස් සිටින අයවලුන්ගෙන් සම්බන්ධතාවයෙන් යුතුව වසරක් ඇතුලත අයකර ගත යුතු බවත් එසේ කල නොහැකි නම් රෙජිමේන්තු සුභ සාධක ගිණුමෙන් කපා හැරිය යුතු බවටත් නිගමනය කර ඇති බවත්.

- එම දෙවන මූලික පරීක්ෂණ උසාවි වාර්තාව අනුව ලබාදුන් යුධ හමුදාපති නිගමනයට අනුව මෙම පැමිණිලිකරු රු:618,750/-ක මුදලක් ගෙවිය යුතු බවත්.

- පැමිණිලිකාර බලලත් නිලධාරි මෙම ප්‍රශ්නගත ගිණුමේ ගිණුම් අංශභාර ලිපිකරුවෙකු ලෙසද කටයුතු කර 2012.08.21 දින සිට ගිණුම්භාර බලලත් නිලධාරි ලෙස සෙ/100304 බනි1 කේ.ටී.ආර්. දයානන්ද වෙතින් අදාළ තනතුර භාරගෙන ඇති බවත්.

- ඒ අනුව 2009-2013 කාලවකවානුව තුළ ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකා සුභසාධක ගිණුම් තුළ රු:4,027,000/-ක අක්‍රමිකතාවයක් සිදුව ඇති බවත්, ඊට අදාල යුපො21 නඩත්තු කිරිම මෙම පැමිණිලිකාර බලලත් නිලධාරි හා සෙ/100304 බනි1 කේ.ටි.ආර්.දයානන්ද සිදුකර ඇති බවත්, ගිණුම්භාර නිලධාරින්ගේ වගකිම් විරහිත ක්‍රියා පිලිවෙත හේතුවෙන් ඔවුන් මෙකි ගිණුම් නඩත්තු නොකිරිම හා අධීක්ෂණය නොකිරිම හේතුවෙන් මෙම බලලත් නිලධාරින්හට ඔවුන්ගේ අභිමතය පරිදි ලේඛන වල සටහන් තැබිමෙන් අක්‍රමිකතාවයක් සිදුකිරිමට අවස්ථාව උදාවි ඇති බවත්,

- ශ්‍රී ලංකා යුද්ධ හමුදා සන්නාහ සන්නද්ධ බලකා නිලධාරින්ගේ හා සෙසු නිලයින්ගේ සාමාජික ඉතිරි කිරිම් මුදලින් නිර්මාණය වූ මෙම ගිණුම තුළ මෙවැනි අක්‍රමිකතාවයක් සිදුවූ බැවින් එම මුදල ප්‍රතිපූර්ණය විය යුතු බවත්, එලෙස ප්‍රතිපූර්ණය කළ හැකි එකම ක්‍රියාමාර්ගය එම මුදල ඒ සදහා වගකිව යුතු අයවලුන්ගෙන් අයකර ගැනිම පමණක් බවත්,

- ඒ අනුව මෙකි අක්‍රමිකතා මුදලින් අයකර ගැනිමට නියමිත මුදල පැමිණිලිකාර බලලත් නිලධාරි සමග සම්බන්ධතාවයෙන් අයකර ගැනිමට නොහැකිවිම මත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත රු:18,000/- බැගින් 2020 ඔක්තොම්බර් මස සිට මේ දක්වා අයකර ගැනිමට කටයුතු සිදුවෙමින් පැවතියද ආරක්ෂක අමාත්‍යංශයෙන් ලැබුණු උපදෙස් හා 2021.04.30 දිනැති විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ලිපිය අනුව ඉදිරියේදි අක්‍රමිකතාවයන්ට අදාළ මුදල් විශ්‍රාම වැටුප් මගින් අයකර ගැනිමට කටයුතු නොකර නඩු පවරා අයකර ගැනිමට කටයුතු කරන ලෙස යුද්ධ හමුදාව වෙත දැනුම් දි ඇති හෙයින් මෙම නිලධාරියාගෙන් අය විය යුතු මුදල් ඔහුගේ සුභසාධක ගිණුමේ ඉතිරි කිරිම් වලින් අයකර ගෙන අවශේෂ මුදල සදහා නඩු පවරා අයකර ගැනිම ඉදිරියේදි සිදුවනු ඇති බවත්, ඒ අනුව රදවාගෙන ඇති පැමිණිලිකරුට හිමි සුභසාධක ඉතිරිකිරිම් මුදල් පැමිණිලිකරු වෙත නිරවුල් කිරිමේ හැකියාවක් නොමැති බවත් සදහන් කර ඇත.

<u>නිරීක්ෂණ</u>

- 2009.07.01 දින සිට 2013.09.30 දින දක්වා කාලසිමාවට අදාළව ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකා රෙජිමේන්තු සුභසාධක ගිණුම් විගණනයට ලක්කර ඇති අතර එහිදි රු:2,377,000/-ක මූල්‍ය අක්‍රමිකතාවයක් සිදුවි ඇති බව නිරීක්ෂණය කර ඒ සදහා මූලික පරීක්ෂණ උසාවියක් පත්කර ඇති අතර ඊට අදාළ යුධ හමුදාපති නිගමනය 2020.05.12 දින ලබාදි ඇති බව නිරීක්ෂණය වේ.

- එම යුධ හමුදාපති නිගමනය අනුව සිව්දෙනෙකු එනම්, මේජර් අයි.එම්.එස්.එස්. ඉලංගකෝන් මේජර් කේ.එම්.එස්.ඩබ්. ජයවර්ධන (විශ්‍රාමික), සෙ/100304 බනි1 කේ.ටි.ආර්. දයානන්ද (විශ්‍රාමික) හා සෙ/102186 බනි1 එන්.ඩබ්.ආර්.ගුණරත්න (විශ්‍රාමික) යන අය

වැරදිකරුවන් කර ඔවුන් වෙතින් වෙන් වෙන් ප්‍රතිශත වශයෙන් මෙම මුදල් අය කර ගත යුතු බවට තිගමනය කර ඇති බව ද පෙනී යයි.

- යුධ හමුදාපතිවරයාගේ පළමු තිගමනයේදී සේවයේ යෙදී සිටින නිලධාරින්ට එරෙහිව විනයානුකූලව කටයුතු කර අදාළ මුදල් ප්‍රතිශතය අයකර ගැනීමටත් විශ්‍රාමික අයවලුන් සමග සම්බන්ධයෙන් යුතුව එම මුදල් අයකරගත යුතු බවටත් එසේ අයකර ගත නොහැකි වන්නේ නම් ඔවුන්ගේ විශ්‍රාම වැටුපෙන් අදාළ මුදල් අයකර ගත යුතු බවටත් තිගමනය කර ඇති බව නිරීක්ෂණය වේ.

- එම යුධ හමුදාපති තිගමනයට අනුව කොමිෂන් සභාවට පැමිණිලිකර ඇති සෙ/102186 බති1 එන්.ඩබ්.ආර්. ගුණරත්න වෙතින් අදාල අක්‍රමිකතා මුදල් අයකර ගැනීමට නොහැකිවීම මත යැයි සඳහන් කරමින් පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුපෙන් රු:18,000/- බැගින් 2020 ඔක්තෝම්බර් මස සිට අයකර ගැනීමට වගඋත්තරකාර පාර්ශවය කටයුතු කර තිබුණද එම යුධ හමුදාපති තිගමනයට යටත් වූ විශ්‍රාමික සෙ/100304 බති/කෙ.ටි.ආර්. දයානන්ද වෙත යුධහමුදාපති විසින් 2021 ජුනි 21 දිනැතිව දන්වා යවා තිබුණේ මෙම සුභසාධක ගිණුමේ මුදල් සබැඳිව ක්‍රියා කිරීමේදී එම මුදල් රාජ්‍ය මුදල් නොවන බැවින් විශ්‍රාම වටුපෙන් අයකර ගත නොහැකි බැවින් ඔහුට හිමි ඒකක ඉතුරුම් හෝ වෙනත් ඉතිරිකිරීම් වලින් අයකරගත යුතු බවත්, ඒ සඳහා ඉතුරුම් මුදල් ප්‍රමාණවත් නොවන්නේ නම් සිවිල් අධිකරණය වෙත නඩු පැවරීමට නිති සේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දන්වා ඇති බවත් ය. මේ අනුව එකම හමුදාපති තිගමනයට යටත් වූ එකම තනතුරු දරන විශ්‍රාමික නිලධාරින් දෙදෙනාට දෙයාකරයකින් කටයුතු කර ඇති බව තිරීක්ෂණය වේ.

- මෙම පළමු මූලික පරීක්ෂණ උසාවියේදී ඉදිරිපත් වූ සාක්ෂි අනුව සිදුවී ඇති මුළු අක්‍රමිකතාවයේ වටිනාකම රු:4,027,000/-ක් බවට සංශෝධනය විය යුතු බවටත් ඒ අනුව ඌනතා වටිනාකම රු:1,650,000/-ක් බවටත් තිගමනය කර ඒ සඳහා නැවත මූලික පරීක්ෂණ උසාවියක් පවත්වා ඇති අතර එහිදී යුධ හමුදාපතිවරයාගේ පළමු තිගමනයේදී වරදකරුවන් වූ නිලධාරින් සිව්දෙනාගෙන්ම යුධ හමුදාපතිවරයාගේ පළමු තිගමනයේදී අයකරගත් මුදල් ප්‍රතිශත ප්‍රමාණවලින්ම මුදල් අයකර ගැනීමට තිගමනය කර ඇති බව දැකිය හැකි ය.

- යුධ හමුදාපතිවරයාගේ දෙවන තිගමනයේ සඳහන් කර ඇත්තේ විශ්‍රාමික අයවලුන් මේ වන විට යුධ හමුදාවෙන් විශ්‍රාම ගොස් ඇති බැවින් ඔවුනට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට හැකියාවක් නොමැති බැවින් මෙකී අක්‍රමිකතාවයට අදාළ මුදල රජයේ මුදල් නොවන බැවින් වසරක් ඇතුළත එම අයවලුන් සමග සම්බන්ධතාවයෙන් යුතුව එම මුදල් අයකර ගැනීමට හෝ එසේ කළ නොහැකි නම් සුභසාධක ගිණුමෙන් කපා හැරිය යුතු බවත් ය.

- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙනුවෙන් 2024.02.20 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයට සහභාගිවූ අධ්‍යක්ෂ ප්‍රතිපත්ති හා විමර්ශන ඩබ්.පී.එම්.යූ. වීරසිංහ මයා දන්වා සිටියේ පැමිණිලිකරු කරන ලද ඉල්ලීම් අනුව කරුණු පරීක්ෂා කර බැලීමේදී අක්‍රමිකතාවය සිදුවී ඇත්තේ ශ්‍රී ලංකා යුධ හමුදාව තුළ පවත්වාගෙන යන රෙජිමේන්තු සුභසාධක ගිණුමක බව අනාවරණය වී ඇති බවත්, ඒ අනුව මෙම අයකිරීම රජයට අයවිය යුතු මුදල් ලෙස සැලකිය නොහැකි බවත්, මෙම අයකිරීම 1981 යුධ හමුදා විශ්‍රාම වැටුප් පාරිතෝෂික සංග්‍රහයේ රෙගුලාසි අංක 31 මගින් ආවරණය නොවන බව නිරීක්ෂණය කර ඇති බවත්, මෙම කරුණු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් ආරක්ෂක අමාත්‍යාංශය හා යුධ හමුදාවේ වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ වෙත දැනුම් දී ඉහත අනාවරණය අනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ රඳවා තිබූ 2021 අප්‍රේල් මස සිට 2023 ජනවාරි මස දක්වා පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුපෙන් අයකර ගත් මුදල් වන රු:390,000/-ක මුදල 2023 පෙබරවාරි මස විශ්‍රාම වැටුපට එකතු කර පැමිණිලිකරුට ගෙවා ඇති බවත් ය. පැමිණිලිකරුගේ මාසික විශ්‍රාම වැටුපෙන් මේ වන විට කිසිදු අයකිරීමක් සිදු නොකරන බවද දැනුම් දී ඇත.

- ඒ අනුව මේ වන විට පැමිණිලිකරුගෙන් නීත්‍යානුකූල නොවන අයුරින් විශ්‍රාම වැටුපෙන් අයකරගත් මුදල් නැවත ලබා දීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු කර ඇති බව නිරීක්ෂණය වුවද, එකී මුදලින් 2021 අප්‍රේල් මාසයට පෙර එනම්, 2020 ඔක්තෝබර් මස සිට 2021 මාර්තු මස දක්වා මාස 06ක වාරික මුදල වන රු:108,000/-ක මුදල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලදුව යුධ හමුදාව විසින් රඳවා ගෙන සිටින බව නිරීක්ෂණය වේ.

- පැමිණිලිකරු විසින් 2024.03.01 දිනැති ලිපියක් කොමිෂන් සභාව වෙත යොමු කරමින් දන්වා ඇත්තේ තමාගේ විශ්‍රාම වැටුපෙන් 2020 ඔක්තෝම්බර් සිට 2021 මාර්තු මස දක්වා මාසිකව රු:18,000/- බැගින් අයකර යුධ හමුදාව වෙත ලබා දී ඇති වාරික 06ක මුදල වන රු:108,000/-ක මුදල හා තමා යුධ හමුදාවට බැදුණු දා සිට විශ්‍රාම යන තෙක් තමාගේ මාසික වැටුපෙන් අනිවාර්යය ඉතිරිකිරීම් සඳහා අඩු කර ගන්නා ලද මුදල වන රු:371,406.70ක මුදල මේ වන තෙක් නිරවුල් නොකර ගිණුමේ රඳවා තබාගෙන සිටින බවත්, එසේ තබා ගත් කාල සීමාවට අදාළ පොලියද සමග එම මුදල ලබා දෙන ලෙසත් තමා විසින් මුදල් අක්‍රමිකතාවයක් සිදුකර ඇත්නම් තමාට එරෙහිව සිවිල් අධිකරණයේ නඩු පවරා එම මුදල් අයකර ගන්නා ලෙසත් ඒ සඳහා ඉදිරිපත් වීමට තමා එකග වන බවත් ය.

- කෙසේ වෙතත් වගඋත්තරකාර පාර්ශවය වන ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය විසින් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති අංක යුහ/නීති/350/මාහිකො/1902(09) සහ 2022.02.22 දිනැති වාර්තාව අනුව පැමිණිලිකරුගෙන් අය විය යුතු මුදල් ඔහුගේ සුභසාධක ගිණුමේ ඉතිරි කිරීම් වලින් අයකරගෙන අවශේෂ මුදල සඳහා නඩු පවරා

අයකර ගැනිම ඉදිරියේදි සිදුවනු ඇති බවත්. ඒ අනුව රදවාගෙන ඇති පැමිණිලිකරුට හිමි සුභසාධක ඉතිරිකිරීම් මුදල් පැමිණිලිකරු වෙත නිරවුල් කිරීමේ හැකියාවක් නොමැති බවත් සඳහන් කර ඇත.

- ඒ අනුව පැමිණිලිකරුගේ සුභ සාධක ගිණුමේ ඉතිරිව ඇති මුදල නැවත ලබාදීම සඳහා වගඋත්තරකාර පාර්ශවයේ එකගතාවයක් නොමැති බව නිරීක්ෂණය වේ.

**නිගමනය**

වගඋත්තරකාර පාර්ශවය විසින් අදාළ මුදල් අක්‍රමිකතාවයන් සම්බන්ධයෙන් පැවැත්වූ දෙවන මූලික පරීක්ෂණ උසාවි වාර්තාව පදනම් කරගනිමින් යුධ හමුදාපතිවරයා විසින් ලබා දී ඇති 2020.11.16 දිනැති නිගමනය අනුව මුදල් අක්‍රමිකතාවය සිදුවූ රෙජිමේන්තු සුභ සාධක ගිණුමේ මුදල් රජයේ මුදලක් නොවන බව පිළිගෙන ඇති අතර ඒ අනුව එවැනි රජයේ නොවන මුදලක් වෙනුවෙන් පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුපෙන් 2020 ඔක්තෝම්බර් සිට 2021 මාර්තු මස දක්වා මාසිකව රු:18,000/-ක මුදලක් බැගින් අයකර යුධ හමුදාව වෙත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් යොමුකළ පසු රදවා ගෙන සිටින රු:108,000/-ක මුදල පැමිණිලිකරු වෙත නොගෙවා රදවාගෙන සිටීම නිත්‍යානුකූල නොවන බව අනාවරණය වන අතර ඒ මගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති නීතිය පසිඳලීම හා ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණයද සර්ව සාධාරණ විය යුත්තේය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බව නිගමනය මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, ඉහත කී මුදල් අක්‍රමිකතාවයන් සිදු වී ඇත්තේ ශ්‍රී ලංකා යුධ හමුදාව තුළ පවත්වාගෙන යන රෙජිමේන්තු සුභසාධක ගිණුමක වන බැවින් එකී ගිණුමේ පැමිණිලිකරුගේ ඉතිරිකිරීම් මුදල් ලෙස රදවාගෙන ඇති රු:371,406.70ක මුදල හා ඊට අදාළ පොලිය පැමිණිලිකරු වෙත නැවත ලබාදීම සහ පැමිණිලිකරු වෙතින් යම් නිත්‍යානුකූල මුදලක් අයකර ගත යුතුව පවතිනම් එය අයකරගැනීම සම්බන්ධයෙන් මතු වී තිබෙන ගැටලූ විසදා ගැනීම සඳහා දෙපාර්ශවය එකග වී ඇති පරිදි නිසි අධිකරණ ක්‍රියාමාර්යක් වෙත යොමු වීම සුදුසු වන බව ද මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය ඉදිරිපත් කර සිටී.**

1. 2020 ඔක්තොම්බර් මස සිට 2021 මාර්තු මස දක්වා (මාස 06ක කාලයක්) පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුපෙන් අයකර පසුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් වගඋත්තරකාර පාර්ශවය වෙත යොමු කරන ලද රු:108,000/-ක මුදල වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරු වෙත ලබා දීමට කටයුතු කළ යුතු ය.

2024. 12 . 27 වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 (7)වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්. ටී. බී. දෙහිදෙණිය
සභාපති,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත්: 01. අමාත්‍යතුමා, - කරුණු දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.